සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන
රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், வியாபார அபிவிருத்தி மற்றும்
கீழுழைப்பு பயன்பாட்டு அரச வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment, Business
Development and Underutilized State Resources Development


---

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>**My No** DSD/HO/12/MEDIA/CIRCULAR 2020 | ඔබේ අංකය<br>உமது இல<br>**Your No** ………………………… | දිනය<br>திகதி<br>**Date** 2020.08.28 |

**2020 චක්‍රලේඛ 01**

දිස්ත්‍රික් ලේකම්/සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,

ප්‍රාදේශීය ලේකම්,

සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ / සමෘද්ධි සහකාර අධ්‍යක්ෂ,

සමෘද්ධි කළමනාකරු,

සමෘද්ධි සංවර්ධන නිලධාරී.

**සමෘද්ධි FM අන්තර්ජාල ගුවන් විදුලිය හා සමෘද්ධි e පුවත්පත පිළිබඳ දැනුවත් කිරීම.**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන කාර්යයන් වඩාත් වේගවත්ව ජනගත කිරීම උදෙසා සංවර්ධන සන්නිවේදනයේ නව මානයන් විවර කරමින් සමෘද්ධි FM හා සමෘද්ධි e පුවත්පත2020.07.02 සිට ජනගත කර ඇත.

දිස්ත්‍රික් , ප්‍රාදේශීය හා ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් සිදු කරන ක්‍රියාකාරකම් පිළිබඳ සමෘද්ධි පුවත් මෙන්ම, නිලධාරින්ගේ, ප්‍රතිලාභින්ගේ ප්‍රතිලාභී ප්‍රජාවගේ දරුවන්ගේ නිර්මාණ සඳහා ද මෙම මාධ්‍ය දෙක තුලම ඉඩ හසර වෙන් කර ඇත.

ඒ අණුව අදාල තොරතුරු,ප්‍රවෘත්ති හා ඡායාරූප පුහුණුව ලත් ප්‍රාදේශීය සමෘද්ධි සන්නිවේදකවරුන් මගින් samurdhimedia2020@gmail.com විද්‍යුත් ලිපිනයට යොමු කළ හැක.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මාධ්‍ය අංශය මගින් ක්‍රියාත්මක මෙම විද්‍යුත් හා මුද්‍රිත ක්‍රියාන්විතයේ දී පහත පරිදි ඒ හා එක්විය හැක.

**සමෘද්ධි FM**

සතියේ දින 07 තුලම www.samurdhifm.lkමගින් හෝ Google Play Store මගින් samurdhi FM දුරකතන යෙදවුම බාගත කරගැනීමෙන් සමෘද්ධි FM අන්තර්ජාල රේඩියෝවට සවන්දිය හැක.

---


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

**<u>සමෘද්ධි "e" පුවත්පත.</u>**

සෑම සතියකම පළමු හා තෙවන බදාදා දිනයන්හි භාෂා ත්‍රිත්වයෙන් අන්තර්ජාලයට මුසු කෙරේ.www.samurdhiepaper.lk /www.samurdhiepaper.com මගින් හෝ Google Play Store මගින් samurhdi e paper වෙත ගොස් තමන් කැමති භාෂා මාධ්‍යයකින් බාගත කරගැනීමෙන් පුවත්පතපරිශීලනය කළ හැක.

මෙම නව මාධ්‍ය මෙහෙයුම ඔස්සේ ඉතා ක්ෂණිකව පණිවුඩ හා තොරතුරු සම්ප්‍රේෂණය කිරීමේ හැකියාව උදාවෙන හෙයින් සියලුම සමෘද්ධි බැංකු හා බැංකු සමිති තුල සමෘද්ධි fmඅන්තර්ජාල රේඩියෝව සවන් දිය හැකි පරිදි අවශ්‍ය ශබ්ද උපකරණ( Sub woofer වැනි) සවිකර ගැනීම සුදුසු වේ.ඒ සඳහා වැය ගිණුම - මිශ්‍ර වියදම් (කේත අංක 2126)යටතේ රු.5,000.00ක උපරිමයකට යටත්ව වැය දැරිය හැකි වේ.

එමෙන්ම සමෘද්ධි fm අන්තර්ජාල ගුවන්විදුලිය සවන්දිය හැකි ආකාරය හා සමෘද්ධි e පුවත්පත පරිශීලනය කළ හැකි ආකාරය පිළිබඳව සමෘද්ධි ප්‍රතිලාභී ප්‍රජාව හා ස්මාට් ජංගම දුරකතන භාවිත කරන සමෘද්ධි ප්‍රතිලාභී ප්‍රජාව හා සමෘද්ධි බැංකු ගණුදෙනුකරුවන් දැනුවත් කිරීමටද කාරුණික වන්න.

එමෙන්ම සෑම බ්‍රහස්පතින්දා දිනකම පෙ.ව.9.00 සිට පෙ.ව.10.00 දක්වා සමෘද්ධි විෂයට අදාලව නිලධාරින්ගේ සහ ප්‍රතිලාභීන්ගේ ගැටලු දුරකතන අංක 077 8312930 මගින් සජීවිව මෙමනාලිකාව ඔස්සේ මා වෙත ඉදිරිපත් කළ හැක.ඒ සඳහා කඩිනම් විසඳුම් ලබාදීම අපේක්ෂාවයි.

සමෘද්ධි වැඩසටහනේ ක්‍රියාන්විතයන් පිළිබඳව නව මාධ්‍ය ඔස්සේ ප්‍රචලිත කිරීමට උත්සාහයක යෙදෙන මේ මොහොතේ දී සියලු දෙනාගේ සහාය ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලමි



ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් - 01.ලේකම්, සමෘද්ධි,ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, වහ්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. — කා.දැ.ස

02.අධ්‍යක්ෂ, ක්ෂුද්‍ර මූල්‍ය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව — අ.ක.ස

03.ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව — කා.දැ.ස.